UNIVERSITY OF RUHUNA
06 JUL 2023
LIBRARY - MATARA

රුහුණ විශ්වවිද්‍යාලය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

**2020/2021 අධ්‍යයන වර්ෂය - ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය**

**පළමු සමාසික අවසාන පරීක්ෂණය - 2021 නොවැම්බර්**

**MAE 5103 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය**

එක් කොටසකින් ප්‍රශ්න (02) දෙක බැගින් තෝරාගෙන <u>ප්‍රශ්න හතරකට (04) පමණක්</u> පිළිතුරු සපයන්න.

**කාලය : පැය තුනයි.**

---

<u>පළමු කොටස</u>

01.

I. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනය සම්බන්ධයෙන් පසුගිය කාලය තුළ ලබා ඇති ප්‍රගතිය පිළිබඳ විමසුමක යෙදෙන්න. (ලකුණු 05)

II. ග්‍රාමීය දරිද්‍රතාවයේ කැපී පෙනෙන ලක්ෂණ කවරේ ද? (ලකුණු 03)

III. ශ්‍රී ලංකාවේ දිලිදුකම පිටුදැකීම සඳහා අනුගමනය කරනු ලැබ ඇති ප්‍රතිපත්ති පිළිබඳ විමසුමක් කරන්න. (ලකුණු 04)

IV. ආර්ථික ලිහිල්කරණය, දරිද්‍රතාව කෙරෙහි ඇති කළ බලපෑම ඔබ හඳුනාගන්නේ කෙසේද? (ලකුණු 03)

02.

I. තිරසාර සංවර්ධන අරමුණු ලේඛනගත කොට එම අරමුණු ලගා කර ගැනීමට ඉදිරිපත් කරනු ලැබූ ගෝලීය සැලැස්ම පැහැදිලි කරන්න. (ලකුණු 07)

II. තිරසාර සංවර්ධන අරමුණු කරා ලගා වීමට ශ්‍රී ලංකාව කොතෙක්දුරට සමත්වී ඇත්දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

03. පහත සඳහන් දෑ පිළිබඳව විස්තරාත්මක සටහන් ලියන්න.

I. මෑතකාලීන ශ්‍රී ලංකා ආර්ථිකයට චීනයේ මැදිහත් වීම.

II. ගෝලීය ප්‍රග්ධන ගලනයන්.

III. ගෝලීයකරණය සහ ජාත්‍යාන්තර වෙළඳාම.

(ලකුණු 15)

## දෙවන කොටස

04.

I. "ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදය ආකෘතියේ වෙනසක් කිරීමට කාලය එළඹ ඇතියි" යන තර්කය සනාථ කිරීමට ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කරන්න.

(ලකුණු 05)

II. වර්තමාන ශ්‍රී ලාංකික කෘෂි කාර්මික ක්ෂේත්‍රය හමුවේ අභියෝග රැසක් තිබෙන බව තහවුරු කර හැක්කේ කෙසේද?

(ලකුණු 05)

III. ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට ජාතික වශයෙන් ප්‍රමුඛත්වය දිය යුත්තේ ඇයි?

(ලකුණු 05)

05.

I. "මෑත දශකවල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රම හමුදා සහභාගීත්ව අනුපාතිකය පහළ මට්ටමක නොවෙනස්ව පවතී." ශ්‍රම හමුදාව තුළ ස්ත්‍රීන්ගේ සහභාගීත්ව අනුපාතිකය පහළ මට්ටමක පැවතීමට හේතු කවරේද?

(ලකුණු 7.5)

II. වයස් සංයුතිය රටක ජනගහනය හා සංවර්ධන සම්බන්ධයෙන් ඉතා තීරණාත්මක වූ සාධකයක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 7.5)

06.

I. ශ්‍රී ලංකාව් සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයන්ගේ වර්තමානත්ත්වය පැහැදිලි කොට එහි ගලාඒම් වේගවත් ලෙස වර්ධනය වීමට බාධා කෙරෙන සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 7.5)

II. රටක ගෙවුම් ශේෂ අසමතුලිතතා නිවැරදි කිරීම සඳහා අනුගමනය කල හැකි කෙටි හා දිගු කාලීන ක්‍රමෝපායන් මොනවාදැයි පැහැදැලි කරන්න.

(ලකුණු 7.5)

@@@@@@@@@